
# කාටද ආදරේ



මෙත්මි පූර්නිමා රත්නායක

මෙත්මි පූර්නිමා රත්නායක

මධ්‍ය විද්‍යාලය

ඉබ්බාගමුව

කතෘගේ වෙනත් පොත්

- ★ සිතට සැනසුමක් (යොවුන් නවකතාව)
- ★ උරුමය සොයා (යොවුන් නවකතාව)

මෙත්මි පූර්නිමා රත්නායක

සියළු හිමිකම් ඇවිරිණි

ISBN අංකය 978-624-206-674-5

ඉහළගම

පිලැස්ස

(කුරුණෑගල)

071 8153006

# පෙරවදන

අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය  ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින්උදවු උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය

2023 11 01

# කාටද ආදරේ?

" මට කවුරුවත් එපා. ඔයාලා කවුරුවත් මට ආදරේ නෑ"

ඔන්න වෙනුරි අදත් උදේ පාන්දරම අඬන්න පටන් අරන්.

වෙනුරි කියන්නේ සෙනුරිගෙ නංගි. දැන් ඉතින් දවසම අඬන්න වෙනුරිට ඒක ඇති. සෙනුරිගෙ මේසෙ උඩ තිබුණ පොතක් නැති වෙලා. සෙනුරි බනිනවා වෙනුරිට පොත් ඇදලා කියලා.

"ඔයාගේ පොත ඔයා හොයා ගන්න. " වෙනුරි තරහින් කිව්වා.


අම්මා ළඟපාතක ඉන්නවාද බලලා සෙනුරි වෙනුරිට පාරක් ගැහුවා. ඊට පස්සේ වෙනුරි කාමරෙන් එළියට ගියේ සෙනුරිගේ මේසෙ උඩ තිබුණු පොත් සේරම හතර අතේ විසි කරලා. දෙන්නගෙ සද්දෙ වැඩි වෙනකොට අම්මා ආවා කාමරේට.

"මොකද මේ? " අම්මා ඇහුවේ සැරෙන්.

"අක්කා මට ගැහුවා. " වෙනුරි කිව්වා.

"නංගි මගෙ පොත්ටික විසි කළා. " සෙනුරි කිව්වා.

"රණ්ඩු කර ගන්නේ නැතුව ඉන්න බැරිද හැබැටම?" අම්මා දෙන්නටම සැර දාලා සෙනුරිගෙ පොත් ටික අහුලලා මේසෙ උඩින් තිබ්බා. ඊට පස්සේ වෙනුරි ළඟට ගිහින් වෙනුරිව වඩා ගත්තා.



"එපා එපා එපා " වෙනුරි කෑගහනවා.

"ඔයාලා කවුරුවත් මට ආදරේ නෑ. මම තමයි හැමදේටම වැරදි. ඔයාලට හොඳ අක්කා විතරයිනේ. එපා. මාව අල්ලන්නවත් එපා. "

වෙනුරි අම්මගේ අතේ ඉඳන් අම්මාට ගහමින් අඬනවා.

"එහෙම නෑ පුතේ, ඔයා මගෙ චූටි දූනේ. මම ඔයාටත් ආදරෙයි. "

අම්මා කිව්වා.

" නෑ.නෑ. නෑ. ඔයා මම විසි කරපු අක්කගෙ පොත් ටික අහුලලා තිබ්බනෙ? එහෙනම් අක්කා මට ගහපු එකත් ආපහු ගන්න. " වෙනුරි කියනවා.

ඒත් වෙනුරි දන්නවා අක්කා ගහපු එක අම්මට ආපහු ගන්න බෑ කියලා. ඒත් ඒ හේතුව හොඳයිනේ තව ටිකක් රණ්ඩු වෙන්න.

රෑට බත් උයලා, අම්මා දෙන්නටම කතා කළා බත් කන්න. දෙන්නට බත් කන්න එන්නවත් මතක නෑ. සෙල්ලම් ගෙයක් දාලා ඒකේ සෙල්ලම් කරනවා. වෙනුරි තමයි අම්මා. සෙනුරි දූව. ඒ අම්මයි දූවයි ගමනක් යන්න ලෑස්ති වෙනවා. අම්මා තුන් හතර පාරක් කතා කළාට පස්සේ ඔන්න දෙන්නා ආවා බත් කන්න.



" ආපෝ........... ගොටුකොළ සලාද.   මම කන්නේ නෑ සලාද. මම බොන්නේ ගොටුකොළ කැඳ." ඒ සෙනුරි.

"මේ මොනවද? ඇයි මාළු ඉව්වේ? මට ඕනෙ මාළු බැදලා. " ඒ වෙනුරි.

" ඉස්සරලා මට කවන්න. " සෙනුරි බත් එක අරන් අම්මා ළඟට ආවා.

"බෑ බෑ. මට ඉස්සරලා කවන්න. " වෙනුරිත් කියනවා.


"ඔයා ටිකක් තනියම කන්නකෝ. මම නංගිට කවලා ඉන්නම්. "

"ඔව් ඉතිං, අම්මට හොඳ අම්මගෙ චූටි දූ සිඟිත්තනෙ. එයා කරන මොකවත් කාටවත් පේන්නේ නෑ නෙ. එයාටම කවා ගන්නකෝ. අද මට බත් එපා. "

එහෙම කිව්වෙ සෙනුරි

"නෑ නෑ. අම්මා මටත් ආදරේ නෑ. හැම තිස්සෙම රණ්ඩු කරනවා කියලා මට තමයි බනින්නේ. අර බූලා එහා ගෙදර ටොමිත් එක්ක කොච්චර රණ්ඩු කරනවද? කෝ ඉතිං අම්මා බනිනවද? "

වෙනුරි ආයෙත් එයාගේ ගෝරණාඩුව පටන් අරන්.



"නෑ නෑ. අම්මා මටයි ආදරේ නැත්තේ. හැමදාම මට තමයි කන්නෙ නෑ කියලා බනින්නේ. අර බූලා සමහර දවසට බත් කන්නෙම නෑ. බත් එක හලලා දානවත් එක්ක. ඒත් අම්මට ඒවා පේනවද? මට කවන්නෙත් නෑ. නොකා හිටියත් මටම තමයි බනින්නේ. "

බත් කන්න පටන් ගත්තෙම රණ්ඩු වෙවී. ඒ වුණාට දෙන්නම දන්නෙ නැතුව අම්මා දෙන්නටම එකම පිඟානෙන්ම බත් ටික කවලා.

"මම නම් ඔන්න අම්මට කරදර කරන්නෙ නෑ. මම තනියම දත් මදිනවා. "

වෙනුරිට ඕනෙ අම්මට කරදර නොකර ඉන්න නොවෙයි. අක්කට වැඩිය මම හොඳයි කියලා පෙන්නන්න.

"සෙනුරී, දත් මදින්න. " අම්මා කියනවා.

ඒත් සෙනුරි මදින දත් ! අම්මා බුරුසුව අරන් බලෙන්ම දත් ටික මදිනකල් සෙනුරි බලාගෙන ඉන්නවා. මැදලා දෙන්න හැදුවත් ඒකට ඉඩ දෙන්නෙත් නෑ.

ඊ කියන්න කියන කොට ආාාා කියනවා.

ආාාා කියන්න කියන කොට ඇඹරෙනවා. එහාට මෙහාට දඟලනවා එතකොට අම්මට තරහ යනවා. සමහර වෙලාවට අම්මා සෙනුරිට පාරක් ගහනවා.

හරී......... ඔන්න සෙනුරි ආයෙත් අඬන්න පටන් ගන්නවා.



"මගෙ විතරද ඔච්චර දත් මදින්න ඕනෙ? නංගි කළේ බොරු. මම දැක්කනෙ දත් බෙහෙත් ටිකත් විසි කෙරුවා. දත් මැද්දෙත් තුන් පාරයිද කොහෙද?"

"ඉතිං නංගි බොරු කළොත් නංගිට තියේවි. " අම්මා කියනවා.

"ඉතිං බූලා කවදාවත් දත් මදිනවද? කෝ අම්මට ඒවා පේනවද? "

ඔන්න අම්මට ඒ පාර තවත් චෝදනා පත්තරයක්ම.

වෙනුරි ටිකක් කල් ඇතුව නිදා ගන්නවා. එයා තවම පොඩියිනේ. ඒ වුණාට සෙනුරි ඒ වෙලාවට නිදා ගන්නේ නෑ.

"පුතා, හෙට ඉස්කෝලේ ගෙනියන පොත් හදාගන්න. "


අම්මා සෙනුරිට කියනවා.

"ඉතිං ඕව නංගිටත් කියන්නකෝ. "

"ඇයි නංගිට විතරක්, බූලට කියන්න එපාද?" අම්මා අහනවා.

"අම්මා, මගෙ සුදු අම්මනෙ. මගෙ පොත් ටික හදලා දෙනවද? මට ගණන් ටිකක් හදන්න තියනවා. මම ඒක හදන්නම්. "

අම්මා සෙනුරිගෙ පොත් ටික හදලා දුන්නා. ඒත් සෙනුරි හදපු ගණනක් නෑ. ඊට පස්සේ ගිහින් නිදා ගත්තා.



අම්මා උදෙන්ම නැගිටලා බත් ඉව්වා. ඉස්කෝලේ ගෙනියන්න කෑමත් හැදුවා. ඊට පස්සේ සෙනුරිටයි වෙනුරිටයි ඇහැරෙව්වා.

"අනේ අම්මා ......... " වෙනුරි අනික් පැත්තට හැරිලා ගුළි වුණා.

"අනේ අම්මා .......... " සෙනුරි බිත්තියේ මුල්ලටම ගිහින් ගුළි වුණා.

හැමදාම ඔහොම තමයි. අම්මා දෙන්නම උස්සගෙන ඇවිල්ලා කුස්සියේ දිග පුටුව උඩින් තියලා තේ හදලා දුන්නා.

"අනේ අම්මා බූලටත් ඇහැරවන්නකෝ "

"ඇයි ඉස්කෝලේ යන්නද?"

"අම්මා අපට ආදරේ නෑ. හරියට නිදා ගන්නවත් දෙන්නෙ නෑ. "

"ඔව් ඔව් අම්මා අපට ආදරේ නෑ. අපටමයි බනින්නේ. "




"රණ්ඩු වෙනවා කියලා බනිනවා. බත් කන්නෙ නෑ කියලා බනිනවා. හරියට දත් මදින්නෙ නෑ කියලා බනිනවා. ඊයෙ තව මොකද්දෝ කියලා බැන්නා. මට ඒක මතකත් නෑනෙ දැන්. "

එහෙම කිව්වේ සෙනුරි


"ඔව් ඔව්. මම කාටවත් ආදරේ නෑ. " ඒ අම්මා.

"නෑ නෑ අම්මා ආදරෙයි. "

"කාටද දන්නවද? "



"බූලට"





පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කරගෙන පොතපතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධාපනයේ දිශාන්තිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

" දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 11 01